# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 1.20 යි.  තැපැල් ගාස්තුව : රු. 1.15

# 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.-ඕ. 19/86

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

(ආ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ විනිශ්චය කාරවරයන් හා රජයේ නිලධරයන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ රජයේ නිලධරයන්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබූ අධිකරණ නිලධරයන් සහ උපදේශන ගත රජයේ නිලධරයන් සහ අමාත්‍යාංශවල සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධර යන්." ;

(ආ) එම උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඇඅ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත හෝ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හෝ 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත හෝ යටතේ මැතිවරණ හෝ ඡන්ද විමසීම් වල කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නිලධරයන් ;

(ඇආ) වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතිවල විධායක නිලධරයන් ;

(ඇඇ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත, 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත හෝ

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත යටතේ පවත්වනු ලබන මැතිවරණවල දී හෝ ඡන්ද විමසීම්වල දී තෝරා පත්කර ගැනීම සඳහා නාම යෝජනා කරන ලද අපේක්ෂකයෝ ;

(ඈඈ) ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශන කර ඇත්තේ යම් ප්‍රවෘත්ති පත්‍ර සම්බන්ධයෙන් ද එම ප්‍රවෘත්ති පත්‍රවල අයිතිකරුවෝ, කර්තෘවරු සහ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයෝ ;

(ඈඉ) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද කොටස්වලින් බහුතරයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දරන්නා වූ ද සමාගම්වල සභාපතිවරු, අධ්‍යක්ෂවරු සහ මාණ්ඩලික නිලධරයෝ ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තිය අගට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

"එසේ වුව ද මේ පනත අදාළ වන්නා වූ, 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈඇ) ඡේදයේ සඳහන් වූ තැනැත්තකු, එම ඡේදයේ සඳහන් පනත්වලින් යම් පනතක් යටතේ තෝරා පත්කර ගැනීම සඳහා මැතිවරණ අපේක්ෂකයකු හෝ ඡන්ද අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබූ දිනයේ පැවති ආකාරයට ඔහුගේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් එසේ නාම යෝජනා කරනු ලැබූ දිනයේදී හෝ අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු, සංවර්ධන සභාවක හෝ වෙනත් පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් ක්‍රියා කිරීමට හෝ අසුන් ගැනීමට හෝ ඡන්දය පාවිච්චි කිරීමට හෝ පෙර, සහ ඡන්ද විමසීමක දී පරාජිත අපේක්ෂකයකු සම්බන්ධයෙන් වන විට, නාමයෝජනා භාරගැනීමේ දින සිට සය මාස තුනක කාලයක් ඇතුළත කළහොත් ඔහු මේ උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ ලෙස සලකනු ලැබිය යුතු ය";

(ආ) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ පළමුවන වත්කම් හා බැරකම් ප්‍රකාශය කිරීමට නියමිත සෑම තැනැත්තකු ම, එවූ තැනැත්තා මේ පනත අදාළ වන තැනැත්තකුව සිටීම අවසන් වුවහොත් මිස, එක් එක් වර්ෂයේ ජූනි මස තිස් වන දින වන විට එම වර්ෂයේ මාර්තු මස තිස් එක වන දින පැවති පරිදි වූ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයන් නියමිත ආකෘති

යෙහි කළ යුතු අතර මේ පනත යටතේ ඔහුගේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් කරන ලෙස ඔහුට පළමු වෙන් නියම කරනු ලැබූ දිනයේ දී ඔහු දැරූ වත්කම් හා බැරකම් ඒ ප්‍රකාශයෙහි ඔහු විසින් ඇතුළත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද (2) වන උපවගන්තිය යටතේ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් කළ යුතු තැනැත්තකු යම් වර්ෂ යක මාර්තු මස තිස් එක වන දිනට පෙරාතුව වූ මාස හයක කාලය ඇතුළත යම් දිනයක පැවති පරිදි වූ වත්කම් හා බැරකම් පිළිබඳව ඔහුගේ පළමු ප්‍රකාශය කර ඇති අවස් ථාවක එම වර්ෂය සඳහා තවත් ප්‍රකාශයක් කිරීමට ඔහුට නියම කරනු නොලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 114 වන ව්‍යවස්ථාවේ අර්ථානුකූල වූ අධිකරණ නිලධරයන් සහ උප ලේඛනගත රජයේ නිලධරයන් විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ද ;";

(ආ) එම වගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :—

"(එඅ) (i) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීම පිළිබඳ පනත හෝ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හෝ 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥපනත යටතේ මැතිවරණවල හෝ ඡන්ද විමසීම්වල කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නිල ධරයන් විසින් ;

(ii) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හෝ 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥපනත යටතේ

පවත්වනු ලබන මැතිවරණවල දී හෝ ඡන්ද විමසීම් වලදී තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා කරන ලද අපේක්ෂක යන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ද ;

(එආ) වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති විධායකයන් විසින් කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ද ;

(එඇ) ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශන කර ඇත්තේ යම් ප්‍රවෘත්ති පත්‍ර සම්බන්ධයෙන් ද එම ප්‍රවෘත්ති පත්‍රවල අයිතිකරු වන්, කතෘවරු සහ කතෘ මණ්ඩලයේ සාමාජිකයන් විසින් ප්‍රවෘත්ති පත්‍ර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ද ;

(එඈ) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද කොටස් වලින් බහුතර යක් රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දරන්නා වූ ද සමාගම්වල සභාපතිවරුන්, අධ්‍යක්ෂ වරුන් සහ විධායක නිලධරයන් විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ද,

ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) නිසි බලධරයාට නියමිත ගාස්තුවක් ගෙවීම මත යම් තැනැත්තකුට යම් වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ගෙන්වා ගෙන බැලීමේ අයිතිවාසිකම තිබිය යුතු අතර නියමිත වැඩිදුර ගාස්තුවක් ගෙවූ විට එම ප්‍රකාශයේ සහතික පිටපතක් ලබා ගැනීමේ අයිතිවාසි කම තිබිය යුතු ය.

මේ උපවගන්තියේ, වත්කම් හා බැරකම් ප්‍රකාශයක් සම්බන්ධ යෙන් "නිසි බලධරයා" යන්නෙන් එම වත්කම් හා බැරකම් ප්‍රකා ශය 4 වන වගන්තිය යටතේ කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හා 9අ වන වගන්තිය යටතේ වූ නඩු කට යුත්තක කාර්යය සඳහා හැර, මේ පනත අදාළ යම් තැනැත්තකුගේ දන්නා ධන මූලාශ්‍ර හා ආදායම් මාර්ග සමග නොගැළපෙන ධනය හෝ

දේපළ ඒ තැනැත්තා විසින් මෑතක අත්කර ගන්නා ලදැයි හෝ එවැනි මුදල් ගණුදෙනු හෝ වෙළඳ ගණුදෙනු මෑතක දී කරන ලදැයි හෝ එවැනි වියදම් මෑතකදී කරන ලදැයි හෝ කියා සිටිමින් හෝ ඒ තැනැත්තාගෙන් යම් වත්කම් හා බැරකම් ප්‍රකාශයක අඩංගු දේ පිළිබඳව ඒ තැනැත්තා සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කිරීම හෝ තමා විසින් (1) වන උපවගන්තියෙහි විධිවිධාන යටතේ කරන ලද ලිඛිත නිවේදනයක් මත උචිත බලධරයකු විසින් පවත්වාගෙන යනු ලබන යම් විමර්ශනයක් සම්බන්ධයෙන් ඔහු විසින් ප්‍රසිද්ධ, ප්‍රකාශයක් කිරීම හෝ වරදක් වන්නේ ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තමාගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දී තමාට දැන ගන්නට ලැබිය හැකි, මේ පනත අදාළ වන යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳ සියලු කරුණු සම්බන්ධයෙන්, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ මේ පනත යටතේ නඩු පැවරීමේ කාර්යය සඳහා හෝ මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ හැර රහස්‍යතාව රැකීම ද රහස්‍යතාව රැකීමට ආධාර කිරීම ද සෑම තැනැත්තකු විසින් කළ යුතු අතර, ඒ කිසිම කාරණයක්, එය අදාළ වන තැනැත්තාට හැර, අන් කිසිම තැනැත්තකුට දැනුම් දීම හෝ මේ පනත යටතේ තම කාර්යය ඉටු කිරීමේ දී හෝ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තමාගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දී හෝ තමා සන්තකයට පත් වී තිබිය හැකි ලේඛන හෝ වාර්තා කිසිවක් බලය නොලත් කිසිම තැනැත්තකුට බැලීමට ඉඩ හැරීම හෝ ඔහු විසින් නොකළ යුතු ය : ". තවද

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ රහස්‍යතාව රැකීමට සහ රහස්‍යතාව රැකීමට ආධාර කිරීමට නියමිත යම් තැනැත්තකුට මේ පනත හෝ අල්ලස් පනත හෝ විනිමය පාලන පනත හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත හෝ යටතේ පවරන ලද හෝ පැවරීමට තිබෙන යම් නඩු කටයුත්තක් සඳහා හෝ ඒ පනත්වල විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ අවශ්‍ය විය හැකි පරිදි හැර, කිසිම වත්කම් හෝ බැරකම් ප්‍රකාශයක් හෝ ඒ හා සම්බන්ධ වෙනත් යම් ලියවිල්ලක් යම් අධිකරණයක් වෙත

ඉදිරිපත් කිරීමට හෝ මේ පනත යටතේ ඔහුගේ කාර්යය ඉටු කිරීමේ දී හෝ 5 වන වගන්තිය (3) වන උපවගන්තිය යටතේ ඔහුගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඔහුට දැන ගන්නට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක්, යම් අධිකරණය කට එළිදරව් කිරීමට හෝ දැනුම් දීමට හෝ නියම නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙසේ සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ආආ) එකී යම් ප්‍රකාශයකින් යම් වත්කමක් හෝ බැරකමක් ඕනෑ කමින්ම අත්හරින;";

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(3අ) (1) වන උපවගන්තියේ (ආආ) ඡේදය යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක එම වරදකරු කිරීම ප්‍රකාරව එම වරද සිදුකිරීමට අදාළ වූ වත්කම සියලු බැඳීම්වලින් තොරව රජය වෙත සතු වන්නේ ය.

(3ආ) (3අ) උපවගන්තිය යටතේ රජය වෙත කරන ලද යම් වත්කම් සතු කිරීමක්—

(අ) රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත හෝ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක නම්, රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ අනුමත කරමින් අභියාචනය තීරණය කළ විට ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධ අභියාචනයක් කර නැති අවස්ථාවක නම් රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, ක්‍රියාත්මක විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වගන්තිය ඇතුළත් කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 9අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

“9(1)(ආ) හෝ (ආආ) ඡේදවල සඳහන් වැරදි පිළිබඳ නඩු පැවරීම හා විභාග කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය.

9අ. 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) හෝ (ආආ) ඡේද යටතේ වූ (මේ වගන්තියේ “අදාළ වරද” යනුවෙන් සඳහන් කරනු ලබන) වරදක් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම, නඩු විභාග කිරීම සහ වෙනත් ආකාරයකින් කට යුතු කිරීම, පහත දැක්වෙන මද වශයෙන් වූ වෙනස් කිරීම්වලට යටත්ව, (මේ වගන්තියේ “අපරාධ නඩු විධාන පනත” යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අනුව කළ යුතු ය:—

(අ) අදාළ වරද සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136(1)(අ) වගන්තිය යටතේ වූ කිසිම පැමිණිල්ලක්—

(i) එය ලිඛිතව වුවහොත් ද;

(ii) එය උත්තරවාදියකු විසින් සකස් කර අනු අත්සන් කර ඇතහොත් ද;

(iii) පැමිණිලිකරු විසින් අත්සන් කර ඇතහොත් ද;

(iv) වරද සිදු කළේ යයි කියනු ලබන්නේ යම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් ද මේ පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලබාගත් එම ප්‍රකාශයේ සහතික පිටපතක් සමඟ ඉදිරිපත් කර ඇත්නම් ද

මිස, මහේස්ත්‍රාත්වරයකු විසින් භාර නොගත යුතු ය;

(ආ) 9 වන වගන්තියේ (5) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, අදාළ වරද සඳහා නඩුවක් පැවරීමට නීතිපතිවරයාගේ පූර්ව අනුමතිය අවශ්‍ය නොවිය යුතු ය;

(ඇ) අදාළ වරද සම්බන්ධයෙන් වූ පැමිණිල්ලක් මහේස්ත්‍රාත්වරයකු විසින් භාරගත් අවස්ථාවක, එම වරද සිදු කළේ යයි කියනු ලබන තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු කරගෙන යාමට සෑහෙන හේතු ඇති බව මහේස්ත්‍රාත්වරයා විසින් අදහස් කරන අවස්ථාවක, චූදිතයාගේ

වියදම් හෝ චූදිතයාට සිදුවිය හැකි වියදම් සහ (ඇ) ඡේදය යටතේ ගෙවීමට ආඥා කරනු ලැබිය හැකි යම් වන්දියක් ගෙවීම සඳහා ඇප වශයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් නිරණය කරනු ලබන මුදලක් පැමිණිලිකරු විසින් අධිකරණයේ තැන්පත් කළහොත් මිස, අධිකරණයේ පෙනී සිටින ලෙස එම තැනැත්තාට නියම කරමින් මහේස්ත්‍රාත්වරයා විසින් අපරාධ නඩු විධාන පනතේ 139 වන වගන්තිය යටතේ සිතාසි නිකුත් නොකළ යුතු ය ;

(ඇ) මහේස්ත්‍රාත්වරයකු විසින්, අදාළ වරදට චෝදනා ලැබූ තැනැත්තකු නිදොස් කර හෝ නිදහස් කර පැමිණිල්ල නිස්සාර සහ පීඩාකාරී පැමිණිල්ලක් වූ බව ප්‍රකාශ කරන කවර අවස්ථාවක වුවද මහේස්ත්‍රාත්වරයා විසින් නිරණය කරනු ලබන සාධාරණ ගාස්තුවක් රජයේ වියදම් වශයෙන් ගෙවීමට මහේස්ත්‍රාත්වරයා විසින් පැමිණිලිකරුට ආඥා කළ යුතු අතර චූදිත විසින් දරන ලද වියදම්වල මුදල ද සුදුසු යයි මහේස්ත්‍රාත්වරය විසින් අදහස් කරනු ලබන වන්දි ද පැමිණිලිකරු විසින් තැන්පත් කරන ලද ඇප මුදලෙන් ගෙවන ලෙසට පැමිණිලිකරු ආඥා කළ යුතු ය ;

(ඉ) (ඇ) ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් නියම කළ හැකි වන්දි මුදල් ප්‍රමාණය අපරාධ නඩු විධාන පනතේ 17 වන වගන්තියේ (7) වන උපවගන්තියේ ඇති කිසිවකින් සීමා කරනු නොලැබිය යුතු ය ;

(ඊ) අදාළ වරද සම්බන්ධයෙන් පවරන ලද නඩුවක දී පැමිණිලිකරු විසින් රජයේ වියදම් සහ (ඇ) ඡේදය යටතේ ඔහුට විරුද්ධව නියම කරන ලද වන්දි මුදල ගෙවනු ලැබූ අවස්ථාවක, එම නඩු පැවරීම සම්බන්ධයෙන් අලාභ සඳහා එම පැමිණිලිකරුට විරුද්ධව යම් නඩුවක් යම් සිවිල් අධිකරණයක පැවරීමට හෝ පවත්වාගෙන යාමට චූදිතට හිමිකම් නොලැබෙන්නේ ය ; සහ

(උ) අපරාධ නඩු විධාන පනතේ 318 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇතද, අදාල වරද සඳහා වූ නඩුවක පැමිණිලිකරු විසින්, චූදිත තැනැත්තා ඒ වරදින් නිදොස් කිරීමට විරුද්ධව වූ අභියාචනයක් නීතිපතිවරයාගේ අනුමතිය නොමැතිව ඉදිරිපත් කළ හැකි ය.".

10. පහත දැක්වෙන වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 10අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ අළුත් 10අ වගන්තිය ඇතුළත් කිරීම.

" වත්කම්වල වටිනාකම.

10අ. යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ කරන ලද ප්‍රකාශයක ඇතුළත් යම් වත්කමක් මුදල් වලින් සමන්විත වන අවස්ථාවක හැර, එම වත්කමේ වටිනාකම සඳහන් කිරීමට මේ සමග බල පාන තැනැත්තකුට නියම කරනු ලබන ලෙස මේ වගන්තියේ කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.".

11. 1985 අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) " වත්කම් හා බැරකම් " යන අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

' " වත්කම් හා බැරකම් " යන්නෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ වත්කම් හා බැරකම් අදහස් වන අතර ප්‍රකාශයකට සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ අයිතිව ඇති චංචල හා නිශ්චල දේපළ ද, ප්‍රකාශයට වැඩදායි සම්බන්ධතාවක් ඇති යම් දේපළක් ද ප්‍රකාශය අදාළ වන කාල සීමාව ඇතුළත ප්‍රකාශක විසින් ඔහුගේ කලත්‍රයා හෝ දරුවන් නමින් අත්කර ගන්නා ලද යම් දේපළක් ද ඊට ඇතුළත් වේ ; ';

(ආ) "පළාත් පාලන කොමසාරිස්වරයා" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"විධායක" යන්න වෘත්තිය සමිතියක් සම්බන්ධයෙන් යෙදුනු විට වෘත්තිය සමිති ආඥාපනතෙහි දී ඇති අර්ථය අදහස් වේ;';

(ඇ) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සංවර්ධන සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;';

(ඈ) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"නිලධරයා" යන්න පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් යෙදුනු විට එම පිළිගත් දේශපාලන පක්ෂයේ සභාපති, උප සභාපති, ලේකම් හෝ එම පිළිගත් දේශපාලන පක්ෂයේ විධායක කාරක සභාවේ සාමාජිකයෙකු සහ එම දේශපාලන පක්ෂය සම්බන්ධයෙන් විධාන දීමට නිසි ලෙස බලයලත් වෙනත් යම් තැනැත්තකු ද අදහස් වන අතර, අනුශාසක හෝ සභාපති, හෝ උපදේශක හෝ අන්‍යාකාර වූ හෝ කවර නිල නාමයකින් හැඳින්වුව ද ඒ දේශපාලන පක්ෂයේ නායකයා ද ඊට ඇතුළත් වේ;";

(ඉ) "මාණ්ඩලික නිලධරයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

' "මාණ්ඩලික නිලධරයා" යන්නෙන්—

(අ) රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වූ විට—

(i) 1970 නොවැම්බර් මස 18 වන දිනට කලින් ඇති කරන ලද ධුරයක් වූ ද 1970 නොවැම්බර් මස 18 වන දින දී, වැටුප්, පරිමාණයෙහි ආරම්භක වැටුප, වර්ෂයකට රු. 6,720 ට නොඅඩු වූ නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ එකී ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයක් වූ ද යම් ධුරයක් දරන්නා වූ යම් නිලධරයෙක්,

(ii) 1970 නොවැම්බර් මස 18 වන දිනට පසුව ඇති කරන ලද ධුරයක් වූ ද ධුරය ඇති කරන දිනයේ දී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප (i) වන විෂයයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වූ වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපට නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ පළමු සඳහන් කළ ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නො අඩු වූ ද යම් ධුරයක් දරන්නා වූ යම් නිලධරයෙක්

අදහස් වේ ; ';

(ආ) රාජ්‍ය සංස්ථාවක සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වූ විට—

(i) 1970 නොවැම්බර් මස 18 වන දිනට කලින් ඇති කරන ලද ධුරයක් වූ ද 1970 නොවැම්බර් මස 18 වන දින දී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප වර්ෂයකට රු. 7,200 ට නො අඩු වූ නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ එකී ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයක් වූ ද යම් ධුරයක් දරන්නා වූ යම් නිලධරයෙක්.

(ii) 1970 නොවැම්බර් මස 18 වන දිනට පසුව ඇති කරන ලද ධුරයක් වූ ද ධුරය ඇති කරන දිනයේ දී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප (i) වන විෂයයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වූ වැටුප් පරිමාණ යෙහි ආරම්භක වැටුපට නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ පළමු සඳහන් කළ ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් පරිමාණයකට නො අඩු වූ ද යම් ධුරයක් දරන්නා වූ රාජ්‍ය සංස්ථා නිලධරයෙක්,

අදහස් වේ; '.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.